*Vidyodaya J. Arts, Sci., Lett., Vol.* 5 *Nos.* 1 & 2, *pp.* 47–55, 1972–1976

# ජෝශප් ජොහාන් ලුඩ්විග් විට්ගන්ස්ටයින් සහ නිශාරක්ෂවාදය

විද්‍යෝදය මණ්ඩපයේ භාෂා සහ සංස්කෘතික අධ්‍යයනාංශයේ
**අභයරත්න බණ්ඩාරනායක විසිනි**

වර්තමාන බ්‍රිතාන්‍ය දර්ශනය කෙරෙහි ප්‍රශ්න කිරීමකින් තොරව මහත් බලපෑමක් ඇති කරනු ලැබුවෙකු ලෙස විට්ගන්ස්ටයින් පිළිගැනේ.[1] 1889 උත්පත්තිය ලැබූ මේ වියානා ජාතිකයා මුලින් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උනන්දුවක් දැක්වූවෙකි.[2] ගණිතමය ඥානය පිළිබඳ මනස මෙහෙයවූ ඔහු ශුද්ධ ගණිතය පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ බව කියවේ. මෙහිදීය විට්ගන්ස්ටයින්ට රසල් සහ ෆ්‍රෙගේ යන අය ගැන දත හැකි වූයේ. රසල් යටතේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඔහු ගණිතමය දර්ශනය පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්වූ බව සඳහන් වේ. 1912 සිට 1917 කාලය තුළදී විට්ගන්ස්ටයින් තම "ට්‍රැක්ටේටස්" කෘතියේ වැඩවල නිරත වී සිටි බව කියවේ. එහෙත් ඔහු විසින් ඒ කෘතිය නිමාවට පත්කරනු ලැබුයේ ඔස්ත්‍රියානු හමුද සේවයේ යෙදී සිටියදීය.[3]

විට්ගන්ස්ටයින් වයස 16 යේදී පමණ ෂොපන්හවර්ගේ දර්ශන පිළිබඳව දත් බවත් ඔහුගේ විශ්ව සංකල්පය පිළිබඳව උනන්දුවක් දැක්වූ බවත් කියවේ. මෙයින් ගම්‍ය වනුයේ ෂොපන්හවර් දැඩි බලපෑමක් විට්ගන්ස්ටයින් කෙරෙහි දැක්වූ බවයි.[4] විට්ගන්ස්ටයින් පශ්චාත්කාලීන හියුම් ලෙසට ද ජනප්‍රියතාවක් ඇත. එහෙත් ඔවුන් දෙදෙනා පිළිබඳව පවතින්නේ සෘජු සම්බන්ධතාවක් නොවේ.[5] විට්ගන්ස්ටයින්ගේ දර්ශනය බැලීමේදී අපට ෂොපන්හවර් දෙස ද බැලීමට සිදුවේ. විශේෂයෙන් විට්ගන්ස්ටයින් ඉදිරිපත් කළ ආත්මමාත්‍රවාදය (solipsism) සංකල්පවල සීමිත භාවය හා ඇගයුම් පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකිවන්නේ ෂොපන්හවර්ගේ අදහස් තුළින්ය.[6] විට්ගන්ස්ටයින්ට බලපෑවේ ගුප්ත නායිවාදී ෂොපන්හවර්ගේ දෘෂ්ටිය නොව යථාවාදී අදහස් පමණි. ෂොපන්හවර් ගුප්ත ආකල්පයන්හි එල්බගත් නිට්ෂේ වැනි චින්තකයින් හා සම්බන්ධ වූ සදාචාරමය නොවූ චින්තකයෙකු ලෙස ද පිළිගැනෙන්නෙකි. එහෙත් මෙවැනි අදහස් මත ගොඩනැගුණු චින්තාවක් කෙරෙහි විට්ගන්ස්ටයින් යොමු නොවූ බව මෙහිදී අවධාරණයෙන් දතයුතුවේ. අන් සංකල්පනා සඳහා ද ෆ්‍රෙගේ ගේ සහ රසල්ගේ චින්තාවන් බලපානු ලැබීය. විට්ගන්ස්ටයින්ගේ අනර්ඝතම කෘතිය ලෙස සැලකෙන "ට්‍රැක්ටේටස්" ග්‍රන්ථයේ ප්‍රස්තාවනාවේ ඔහු මෙසේ ප්‍රකාශ කරයි: "මගේ මිත්‍ර බර්ට්‍රම් රසල් මහතාගේ සහ ෆ්‍රෙගේ ගේ ලේඛන තුළින් මා ලැබූ චින්තාවන් මගේ කාර්යය මනා ලෙස ඉටුකර ගැනීමට හැකිවීම පිළිබඳව මා ඔවුනට ණය ගැතිය.[7]

---

1. Pole, D. - The Later philosophy of Wittgenstein, Athlone Press, New York, 1968. (L.P.W.) p. 1.
2. Urmson, J. M. ed. Concise Encycloepedia of western philosophy and philosophers, Hutchinson, London, 1960. (C.E.W.P.) p. 408.
3. Anscomb, G. E. M. 2d. ed.-An Introduction to Wittgenstein's Ttractatus, Hutchinson, 1963, (I.W.T.) p. II.
4. I.W.T., p. 11.
5. I.W.T., p. 12.
6. I.W.T., p. 12.
7. Wittgenstein, L. - Tractatus Logico Philosophicus. Routhledge and Kegan Paul, London, 1922, (Trac) p. 3.

ඔහු 1920 දී පමණ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට පැමිණීමෙන් පසු ප්‍රධාන පෙළේ යථානුභූත වාදීන් දෙපලක් වූ පෙඩ්රික් වයිස්මාන් සහ මොරිෂ් සිලික් යන අය හමුවූහ. 1930 දී ජී. ඊ. මූවර් කේම්බ්‍රිජ් සරසවියේ දර්ශනය පිළිබඳ මහාචාර්ය පදවියෙන් ඉවත් වීමෙන් පසු විට්ගන්ස්ටයින් එම පදවියට පත් වී 1947 වනතුරු එම පදවිය දරා ඇත. ඔහු 1947 දී එම මහාචාර්ය පදවියෙන් ඉවත් වූයේ පර්යේෂණ කටයුතුවල නියැලීම සඳහාය.[8]

චින්තකයෙකු වශයෙන් විට්ගන්ස්ටයින්ගේ අදහස් දළ වශයෙන් කොටස් දෙකකින් දක්විය හැකිය:

1. නියත වශයෙන්ම ලුඩ්විග් විට්ගන්ස්ටයින්ගේ මුල්කාලීන අදහස් නියෝජනය වනුයේ ඔහු 1918 දී පළ කළ ට්‍රැක්ටේටස් කෘතියේය. ඒ හැරෙන්නට 1933–35 අතර කාලය තුළදී විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට කළ දේශන ආශ්‍රිතව පළ වී ඇති පොත්වල ද ඒ අදහස් සටහන් වී ඇත.

2. ඔහුගේ පසු කාලීන චින්තනය දර්ශනික ගවේෂණය (Philosopical Investigation) යන කෘතියෙන් මුල් කාලීන මතයන්ට වඩා වෙනස් දර්ශනික සංකල්පනා ගෙන එන බව පෙනේ. ගණිත විද්‍යා ප්‍රවේශය පිළිබඳව ඉදිරිපත් වූ අදහස් ඔහුගේ මරණින් පසු පළ කරනු ලැබිය. මෙම චින්තාවන් ගණිතමය දර්ශනය (Philosopy of Mathematics) පිළිබඳව පළ වූ පැසුණු අදහස් ලෙස පිළිගැනේ.[9]

ඉහතින් සඳහන් වූ පරිදි ලුඩ්විග් විට්ගන්ස්ටයින්ගේ චින්තනය සැකසී ඇත. ඔහු මුල් කාලයේ දරූ අදහස් හා පසුකාලීන චින්තනය අතර විෂමතා පවතින බව පළවූ කෘති ඇසුරෙන් පැහැදිලි කරයි. විට්ගන්ස්ටයින් තමන් දරූ මුල්කාලීන අදහස්වල විභ්‍රමතා දැක පසුව එම අදහස් සංශෝධනය කළ බව පෙනේ. අප මෙහිදී උත්සාහ කරනුයේ විට්ගන්ස්ටයින් මූලික වශයෙන් දැක් වූ අදහස් හා පසු කාලීනව දරූ චින්තාවන් ද විමසා ඔහු පිළිබඳ සමහර චින්තකයන් විසින් දක්වන ආකල්පයන්හි තාර්කික භව්‍යතාව විමසීමටය. ඔහුගේ ප්‍රථම අවධියේ චින්තාවන් නියෝජනය කෙරුණකී, ශ්‍රේෂ්ඨ කෘතියක් ලෙස රසල් පවා හැඳින් වූ ට්‍රැක්ටේටස් ග්‍රන්ථය. මෙම කෘතිය කිසිම දර්ශනිකයෙකුට ඉවත දැමිය හැකි එකක් නොවන බව රසල් පවා සඳහන් කර ඇත.[10]

ජේ.ඕ අර්මිසන්ගේ මතය වනුයේ විට්ගන්ස්ටයින් ලියූ මේ කෘතිය දර්ශනයේ පවතින ගැටළු සඳහා ඇති නිත්‍ය විසඳුමක් වූ බවය.[11] රසල්ගේ තාර්කික විශ්ලේෂී ක්‍රම විට්ගන්ස්ටයින් විසින් අනුගමනයකළ බව ද කියවේ. විට්ගන්ස්ටයින්ගේ මේ කෘතිය ප්‍රස්තුත 7 ක් මත පදනම් වූවකි. දශම අංක යටතේ ප්‍රධාන ප්‍රස්තුත හැරෙන්නට ඒ ප්‍රධාන ප්‍රස්තුත විග්‍රහ වන අනු ප්‍රස්තුත ගණනාවකින් සමන්විත වේ. ඔහුගේ මුල්කාලීන චින්තනය නිරූපනය කරන එම ප්‍රධාන ප්‍රස්තුත මෙසේය:

1. ලෝකය සිද්ධි වාචක වශයෙන් ගත හැකි සියල්ලයි.[12]
2. සිද්ධිවාචක නම් පරමාණු සිද්ධිවාචකයන්ගේ පැවැත්මයි.[13]

---

8. C.E.W.P. p. 408.
9. C.E.W.P. p. 408.
10. Trac, p. XXII.
11. C.W.E.P. p. 409.
12. Trac. p. 7.
13. Trac. p. 7.

3. චින්තනය වනාහි සිද්ධිවාචකයන්ගේ තාර්කික චිත්‍රයයි.[14]
4. චින්තනය සාර්ථක ප්‍රස්තුතයයි.[15]
5. ප්‍රස්තුතය සරල ප්‍රස්තුතයන්ගේ සත්‍යශ්‍රිතයයි. (truth function)[16]
6. සත්‍යශ්‍රිතයේ සාමාන්‍ය ස්වරූපය මෙයයි. මෙය ප්‍රස්තුතයේ සාමාන්‍ය රූපයයි.[17]

මෙහිදී විට්ගන්ස්ටයින් සත්‍යශ්‍රිතයේ සාමාන්‍ය ස්වරූපයන් මෙසේ විස්තර කොට ඇත:
[P, Ē, N (Ē) ] මෙහි යොදා ඇති සංකේත මෙසේ විග්‍රහ කර ඇත:
P– සියලු පරමාණු ප්‍රස්තුත සඳහා යොදා ඇති සංකල්පයයි.
Ē– මෙය සෑම ප්‍රස්තුත කණ්ඩායමක් සඳහා ඇති සංකේතයයි.
N, (Ē)– යන්න සෑම නිශේධනාත්මක ප්‍රස්තුත සඳහා ඇති සංකේතය වේ. මෙම සම්පූර්ණ සංකේතයෙහි,

[P, Ē, N (Ē) ] අර්ථය වනුයේ පරමාණු ප්‍රස්තුතයන්ගේ ඕනෑම ප්‍රස්තුත කණ්ඩායමක් සාදගත හැකි බවත්, ඒ සියල්ල නිශේධනය කිරීමෙන් නැවත ඒ ප්‍රස්තුත සියල්ලම ලබාගත හැකි බවත්ය. එසේ කිරීමෙන් මෙලෙස අනියත ලෙස ප්‍රස්තුත දිගටම ලබාගත හැකිවේ.[18]

7. අපට ප්‍රකාශ කළ නොහැකි දේ පිළිබඳව අප නිශ්ශබ්ද විය යුතුය.[19]

මෙම ප්‍රධාන ප්‍රස්තුත සම්බන්ධවය අනෙක් ප්‍රස්තුත ප්‍රකාශයට පත්කර ඇත්තේ. කෙසේ වුව ද මෙම ප්‍රධාන ප්‍රස්තුත 7 මගින් ට්‍රැක්ටේටස් ප්‍රධාන තේමාව විදහා පාන බව ඇන්ස්-කොම්බ් පවසයි. මෙයින් භාෂාවත් යථාභූතයත් අතර පවතින ප්‍රධාන නියාමයන් කියවේ.[20] එහෙත් රසල්ගේ විග්‍රහයෙන් පෙනීයනුයේ මෙම ග්‍රන්ථයෙන් විට්ගන්ස්-ටයින් අගනා දර්ශනික මුහුකුට ගණනාවක්ම සොයා දී ඇති බවයි. එනම්,

i ප්‍රස්තුතවාදය
ii චිත්‍ර වාදය
iii සත්‍යශ්‍රිත පිළිබඳ අගයුම
iv ප්‍රකාශකළ හැකි දේ පිළිබඳ සීමා දැක්වීම.

මේ ප්‍රධානවාදයන් තුළින් භාෂා විශ්ලේෂණය මෙන්ම තාර්කික විශ්ලේෂණය ද මෙම ග්‍රන්ථයේ ප්‍රධාන තැනක් ගන්නා බව කිව හැකිය. ''නැත'' සහ ''හෝ'' යන තාර්යකික නිය පදයන්ගේ මෙන්ම අනෙකුත් ප්‍රධාන සංකේතයන්ගේ තාර්කික ස්වරූපය ද මෙහි දක්වා ඇති බව පෙනී යන්නකි.

විට්ගන්ස්ටයින්ගේ මේ කෘතිය පිළිබඳව කාල් පොපර් මෙවැනි ආකල්පයක් ඉදිරිපත් කර ඇත: ''විට්ගන්ස්ටයින් ප්‍රයත්න දැරුවේ දර්ශනිකයයි හෝ පාරභෞතිකයයි කියන ප්‍රස්තුත ඇත්ත වශයෙන්ම ප්‍රස්තුත නොවන බව හෝ ව්‍යාජ ප්‍රස්තුත වන බව හෝ

14. Trac. p. 19.
1 . Trac. p. 3
16. Trac. p. 739
17. Trac. p. 11.
18. Trac. p. XV..
19. Trac. p. 1 1.
20. I.W.T. p. 19.

දැක්වීමටය. ඒවා අර්ථ විරහිත හෝ නිරර්ථික බව දැක්වීමටය. සෑම අව්‍යාජ ප්‍රස්තුත හෝ අර්ථ සහිත ප්‍රස්තුත, සරල හෝ පරමාණු ප්‍රස්තුතයන්ගේ සත්‍යශ්‍රිතයන් බව, හා සරල ප්‍රස්තුතයන් පරමාණු සිද්ධිවාචක නිරූපනය කරන බව පෙන්වීමටය. ව්‍යාජ ප්‍රස්තුතයනට අදළ ප්‍රස්තුතයන් නොමැති කල්හි ව්‍යාජ ප්‍රස්තුතයන්හි සත්‍යශ්‍රිතය සරලයන් තුළින් නිර්වචන කළ නොහැක. එමෙන්ම බාහිර සිද්ධිවාචික නිරූපනය වන සරල ප්‍රස්තුතයන් ව්‍යාජ ප්‍රස්තුතයන්හි අඩංගු නොවේ නම් මෙයින්ද ගම්‍ය වනුයේ දර්ශනික හෝ අධිභෞතික යයි පවසන ප්‍රස්තුත අර්ථ විරහිත බවය; ව්‍යාජ බවය.[21]

විට්ගන්ස්ටයින් අධිභෞතික විද්‍යාවේ නිරර්ථකභාවය ප්‍රකට කිරීම සඳහාය සත්‍යශ්‍රිත වාදයත්, ප්‍රස්තුතවාදයත්, සිද්ධිවාචකවාදයත් සඳහන් කෙළේ. නිරීක්ෂණාත්මක නොවන දේ දර්ශනික ලෙස ගත නොහැකි බව විට්ගන්ස්ටයින් සඳහන් කර ඇත. දර්ශනය ස්වාභාවික විද්‍යා ක්ෂෙත්‍රයට අයත් එකක් නොවේ.[22] දර්ශනයේ පරමාර්ථය තාර්කික විභජනයයි.[23] ප්‍රස්තුත විශ්ලේෂණයයි.[24] මොහුගේ චින්තන බොහෝ දුරට පසුකාලීන යථානුභූතවාදයට මහත් පිටුවහලක් වූ බව කියවේ. තාර්කික යථානුභූත වාදය පදනම් කොටගෙන ඇත්තේ දළ වශයෙන් විට්ගන්ස්ටයින්ගේ අදහස් බව පෙනේ. නිරීක්ෂණාත්මක නොවන ප්‍රකාශනයන්ගේ පැවැත්ම අර්ථ ශූන්‍ය ව්‍යාජ දේ ලෙසයි ඔවුන් හඳුන්වා දී ඇත්තේ. ඔවුන් මෙය ගොඩනංවා ඇත්තේ අර්ථය පිළිබඳ වාදයක් ඇසුරුණි. එම අර්ථ වාදයට මුල් වූයේ විට්ගන්ස්ටයින්ගේ අදහස් බව කියවේ. එම නිකායේ ප්‍රධාන පාඨය වූයේ සිද්ධිවාචික කියමනක අර්ථය එහි සත්‍යක්ෂණරීතියය යන්නයි. මේ අනුව කියමනක නිරීක්ෂණය නොකළ හැකි වස්තූන් අඩංගු ප්‍රකාශන සිද්ධිවාචක නොවේ. මෙවැනි ප්‍රකාශන අඩංගු වනුයේ පාරභෞතිකවාදයන්හිය. සිද්ධිවාචක නොවන කියමන් මේ නව රීතිය හේතුකොටගෙන අර්ථ ශූන්‍ය වන නිසා අධිභෞතික විද්‍යාවද අර්ථ ශූන්‍ය වන බව චින්තකයන් ගේ මතය විය. විට්ගන්ස්ටයින්ගේ ඥානිය පිළිබඳව කාල් පොපර් දැක් වූ මතයෙන් ද යථානුභූතවාදී අදහස් විට්ගන්ස්ටයින්ගේ කල්පනා තුළින් ඇති වූවක් බව සනාථ වන්නකි. මහාචාර්ය ඒ. ජේ. එයර් අධිභෞතික ප්‍රකාශන මෙසේ හඳුන්වයි: ''අධිභෞතික ප්‍රකාශන කිසියම් ප්‍රකාශනයකි. මෙම ප්‍රකාශන අරමුණු කරනුයේ සත්‍ය කියමනක් ප්‍රකාශ කිරීමට වුවද එය පුනර්වාචකයක් හෝ ආනුභාවික උපන්‍යාසයක් හෝ ප්‍රකාශ නොකරයි.''[25] මෙම අර්ථය පිළිබඳ වාදය ගෙන එන රීතිය ඒ. සී. ඉවින් ආනුභාවික උපන්‍යාසයක් ලෙස සැලකිය යුතුයයි පවසයි. යථානුභූතවාදීන්ගේ මතය වාදයකට තුඩු දෙන ලෙස සත්‍යක්ෂණයට සම්බන්ධ අර්ථය සහ සත්‍යක්ෂණ මූලධර්මය වශයෙන් දෙකොටසකින් විග්‍රහ වන බව ආචාර්ය පාකින්සන් සඳහන් කරයි.[26] සිද්ධිවාචක අර්ථ පිළිබඳ පැහැදිලි සහ සතුටුදායක අදහස් ඉදිරිපත් නොකෙරෙන බවට මේ කදිම ඉඟියකැයි ද නොයෙක් ඉන්ද්‍රියානුභූතවාදීන් නොයෙක් තත්ත්වයන් එයට ආරූඪ කළද එහි කිසියම් පොදු අනුභාවික පදනමක් තිබෙන බව ඉතා පැහැදිලි කරුණකැයි ද ආචාර්ය කලන්සූරියගේ අදහසයි.[27]

---

21. Mace, C. A. ed - British philosophy in mid-century, Allen and Unwin, London, 1957. p. 163-4.
22. Trac. p. 49 No. 4, 111
23. Trac. p. 49 No. 4. 112.
24. Trac. p. 49 No. 4. 112.
2 . Ayer, A. J. - Language Truth and Logic, Victor Gollan Ltd., London, 1936, p. 41.
26. Parikinson, G. H. R. ed. - The Theory of meaning. Oxford Headings in philosophy, London, 1968. p. 7. (T.M.)
27. කලන්සූරිය ඒ. ඩී. පි. – දර්ශනය ප්‍රත්‍යක්ෂය සහ ඥානය. කොළඹ. 1974. (ද.ප්‍ර.ඥා. පි. 125)

විට්ගන්ස්ටයින් ඉදිරිපත් කළ දර්ශනයේ එන ප්‍රස්තුතවාදය අතුරුවාද දෙකක බාහිර සංකල්පයක් බව ඇන්ස්කොම්බ් පෙන්වා දෙයි.[28] එනම් රූපවාදය හා ග්‍රහවාදයයි. රූපවාදයෙන් කියවුනේ අර්ථ සහිත ප්‍රස්තුත ඉන් බාහිරව පවත්නා සරල සිද්ධි වාචකයන්ගේ චිත්‍රරූප විදහා පාන බවයි. සත්‍යශ්‍රිතවාදයෙන් කියවුනේ සංකීර්ණ ප්‍රස්තුතයන්ගේ සත්‍ය අසත්‍ය භාවය ඊට අඩංගු සරල ප්‍රස්තුතයන්ගේ සත්‍ය අසත්‍යභාවය මත රඳෙන බවයි. විට්ගන්ස්ටයින්ගේ ට්‍රැක්ටේටස්වලින් ඉදිරිපත් වන සත්‍යශ්‍රිතවාදය පිළිබඳ කරුණුත් කාල් පොපර් දක්වන නිරීක්ෂණාත්මක කරුණුත් පිළිබඳව විමසීමේදී අසංස්ථික බවක් නිරූපනය වෙයි. නිරීක්ෂණාත්මක ස්වරූපයක් පිළිබඳව සරල ප්‍රස්තුතයන් ගැන පොපර් සඳහන් කරනත් ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳ යම් හැකියාවක් ගෙනදෙන ප්‍රකාශනයක් ඇත්නම් ඇත්තේ එකක් පමණි. ට්‍රැක්ටේටස්වලට අනුව යම් ප්‍රකාශනයක අරුත් තේරුම් ගත හැකිවන්නේ එය දත හැකි නම් පමණි.[29]

මේ ප්‍රකාශනය නිසා විට්ගන්ස්ටයින් ආනුභවික ස්වරූපයෙන් ඉකුත්ව ගියේය, යන මතයක් දුරිය නොහැක. විට්ගන්ස්ටයින්ගේ රූපවාදය පිළිබඳව 1919 දී රසල් විසින් ද විවිධ මත දක්වා ඇත. ප්‍රස්තුතයක අඩංගු කොටස් දැකිය හැකිද, සිද්ධිවාචකයක කොටස් වශයෙන් දැකගත හැකි අංශ තිබේද, එමෙන්ම ප්‍රස්තුත කොටස් හා සිද්ධිවාචක කොටස් අතර අනුරූප සබඳතාවක් පවතීද යන ගැටළු රසල් ඉදිරිපත් කළ විට ඒවාට පිළිතුරු දීමට විට්ගන්ස්ටයින් උත්සාහගෙන ඇති බව ඇන්ස්කොම්බ් සඳහන් කරයි.[30]

විට්ගන්ස්ටයින්ගේ කෘතියෙන් ඔහුගේ දර්ශනය පිළිබඳව අවබෝධයක් ලැබීමට නම් ඔහුගේ අවධානයට යොමු වූ ගැටළුව පිළිබඳව සිතා බැලිය යුතුව ඇත. ඔහු භාවිතයේ යෙදෙන භාෂාවේ දුර්වලතා දැක එම ප්‍රකාශයන් පිළිබඳව සැක පහළ කළ චින්තකයෙකි. එම ප්‍රකාශන මාධ්‍යයේ පවතින සංදිග්ධතාවන්ගෙන් මිදිය හැකි එකම මඟ ලෙස ඔහු සම්පූර්ණ තාර්කික භාෂාවක අවශ්‍යතාවය සෙවීය. ඔහුගේ මූලික අරමුණ වූයේ එයයි. ඔහුගේ අවධානය යොමු වූ ප්‍රධානම කාර්යය වූයේ නිවැරදිව යමක් ප්‍රකාශ කළ හැකි මාධ්‍යය සෙවීමය. ප්‍රායෝගික කටයුතුවලදී භාෂාව මහත් ව්‍යාකූලත්වයක් දරයි. එසේ නම් අප තනාගත යුතු සම්පූර්ණ භාෂා මාධ්‍යක් තිබිය යුතුය. දර්ශනයේ භාවිත වන ප්‍රස්තුතයන් වැඩි ප්‍රමාණයක් අසත්‍ය නැත. එහෙත් අර්ථ විරහිතය. එම නිසා එවැනි ප්‍රකාශනයකට අපට පිළිතුරු දිය නොහැක. කළ හැක්කේ ඒවායේ ව්‍යාජත්වය සහ හිස් බව පෙන්වා දීම පමණි. මේ න්‍යාය මගින් භාෂාවේ සංකීර්ණත්වය, සරලත්වය, සංයුතිය යන කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ලැබූයේ මේ පරමාර්ථය ඉටුකර ගැනීමේ අභිලාශයෙනි. විට්ගන්ස්ටයින් ඉහත සඳහන් ප්‍රධාන ප්‍රස්තුත හත මාධ්‍යකොට ගෙන ඔහු දකින ගැටළු සඳහා ඇති විසඳුම් ලෙස කරුණු ඉදිරිපත් කළේය.

මේ මූලික ගැටළු නිරාකරණය කිරීමට ප්‍රස්තුතයන්ගේ මුල් ස්වරූපය ලෙස දක්වූ සරල ප්‍රස්තුත විග්‍රහයක යෙදෙන ඔහු ඒවායේ ස්වභාවය මෙසේ විග්‍රහ කරයි:

1. සරල ප්‍රස්තුත අන්‍යොන්‍ය ස්වායත්ත බවක් ඇති ප්‍රස්තුතයි.

උදාහරණ වශයෙන් පෑන රතුය යන සරල ප්‍රස්තුතය[31] අන් ප්‍රස්තුත මත රඳා නොපවතී.

---

28. I.W.T. p. 2 .
29. Trac. p. 2 , No. 3. 263.
30. I.W.T. p. 28.
31. Trac. p. 14 , No. 6. 37 1

පැන රතුය කොපුව නිල් පාටය කීවිට මෙහි ස්වායත්ත බව බිඳී සංකීර්ණත්වයක් ගනී. එහෙත් මෙලෙස ගොඩනැගෙන ප්‍රස්තුත දෙකක් පුනර්වාචකයක් හෝ විසංවාදයක් නොවේ.

2. සරල ප්‍රස්තුත අවශ්‍යයෙන්ම ප්‍රතිජානනය.[32] මෙයින් අදහස් කරනුයේ සරල ප්‍රස්තුතය සත්‍ය වූ විට එයට අනුරූප වූ පරමාණු සිද්ධිවාචකයක් ඇති බවයි. විට්ගන්ස්-ටයින්ගේ විග්‍රහය අනුව පරමාණු සිද්ධිවාචක තිබීම ප්‍රතිජානන වූවකි. ඒවා නොතිබීම නිශේධනයයි. මේ පදනම් මතය ඔහු ප්‍රතිජානන සහ නිශේධන පිළිබඳ කරුණු දැක්වූයේ. ''මිනිසා වැඩ කරයි'' යන්න ප්‍රතිජානන කරුණක් ගෙන එන සරල ප්‍රස්තුතයකි. එහෙත් ''මිනිසා වැඩ නොකරයි'' යන්න නිශේධනාත්මක කරුණක් දක්වන ප්‍රස්තුතයකි.

3 සරල ප්‍රස්තුතයක් සත්‍ය හෝ අසත්‍ය විය හැක්කේ එක් අයුරකින් පමණි.

4. සරල ප්‍රස්තුතයන්හි අන්තර් නිශේධනය සහ බාහිර නිශේධනය කියා වෙනසක් නොමැත. මෙය උදහරණයකින් පැහැදිලි කරතොත් ''ලංකාවේ ජනාධිපති බෞද්ධයකි'' යන්න අන්තර් නිශේධනාත්මක ස්වරූපයක් ගන්නේ මෙසේය: ''ලංකාවේ ජනාධිපති බෞද්ධයෙක් නොවේ''. බාහිර නිශේධනාත්මක ලෙස මෙය දැක්වෙනුයේ ''නොවේ ලංකාවේ ජනාධිපති බෞද්ධයෙක්'' යනුවෙනි.

5. සරල ප්‍රස්තුත නම් නාමයන්ගේ එක්තැන් වීමකි.[34] මෙය විස්තර කරමින් විට්ගන්ස්-ටයින් පවසා ඇති කරුණු මෙසේය: සරල ප්‍රස්තුත නම්වලින් සමන්විතය. එය නම් ඒකාබද්ධ කිරීමකි. එක්තැන් කිරීමකි. ''ළමයා පාඩම් කරයි'' යන්න නාම කීපයක එකතුවකි.

සිද්ධවාචක යන්න නිර්වචනය කරමින් විට්ගන්ස්ටයින් එය යථා ස්වරූපය ලෙස දක්වයි. මෙම යථා ස්වරූපය නිශේධනාත්මක සිද්ධිවාචකයකින්ද දැක්විය හැකි බව සඳහන් කරයි. ''මේසය උඩ සර්පයෙක් නැත.'' යන්න නිශේධනාත්මක සිද්ධි වාචකයකි. සිද්ධිවාචක ස්වභාවයන් සාකච්ඡා කරමින් විට්ගන්ස්ටයින් තම චිත්‍රවාදය ඉදිරිපත් කර ඇත. සිද්ධිවාචක මගින් බාහිර ලොවේ චිත්‍රය විදහාපායි. සත්‍ය චින්තාව ලොවේ චිත්‍රය දක්වයි. මෙයින් පෙන්වා දී ඇත්තේ චින්තනයට අයත් සීමා ද මෙම ප්‍රස්තුත දෙකෙන් විග්‍රහ වී ඇති බවය. චින්තනය පිළිබඳ කරුණු දැක්වූ විට්ගන්ස්ටයින් එය කිසිවිටෙකත් නිශ්තාර්කිත විය නොහැකි බව දක්වයි. සම්ප්‍රදයානුකූල දර්ශනයට අයත් ප්‍රස්තුත නිරර්ථක බවත් එය සත්‍ය අසත්‍ය සීමා තුළින් ඉවත්ව යන බවත් පෙන්වා දෙනු ලැබිය. ඔහු සකල දර්ශනයම භාෂා විචාරයක් ලෙස හඳුන්වයි.[35] දර්ශනයේ පරමාර්ථය අදහස් තාර්කික ලෙස පැහැදිලි කිරීමය. දර්ශනය ක්‍රියාවක් මිස වාදස්කන්ධයක් නොවේ. දර්ශනය කිව නොහැකි දේ සහ කිව හැකි දේ පැහැදිලි කරයි. විට්ගන්ස්ටයින්ගේ සකල දර්ශනමය භාෂා විචාරයක්ය යන මතය බොහෝ විවේචනයට තුඩුදුන් දර්ශනයේ නිශාරක්ෂක වාදයක් (Nightwatchman Theory) බිහිවීමක් ලෙසට විවේචනය වී ඇත. විට්ගන්ස්ටයින්ගේ භාෂා දර්ශනය විවේචනයට ලක් කරමින් ඔහු නිසි දර්ශනික ප්‍රශ්න අමතක කොට දර්ශනයට අනවශ්‍ය ප්‍රකාශ කර ඇති බව

32. Trac. p. 63, No. 4. 2
33. Trac. p. 63, No. 4. 2
34. Trac. p. 9, No. 4. 22
35. Trac. p. 37, No. 4. 0031

කලන්සූරිය සඳහන් කරයි.[36] මේ භාෂා දර්ශනයට අනුව භාෂාව පාවිච්චි කරන්නන් භාෂාමය නියම හා භාවිත නිතර උල්ලංඝනය කරන නිසා මෙය දර්ශනය පිළිබඳ නිශාරක්ෂකවාදයක් යයි වරක් මහාචාර්ය අර්නස්ට් ගෙල්න පැවසූ බව සඳහන් වේ.[37] මෙය දර්ශනයෙන් පලා යන වාදයක් බවත්, බාහිරත්වය, භෞතිකත්වය, මනුෂ්‍යත්වය යනාදිය තේරුම් ගැනීමට ඇති අභිලාෂය වනාහි පැරණි අනුවන ක්‍රියාවක් ලෙස පිළිගන්නා අලස නිශාරක්ෂකවාදය සත්‍ය විය නොහැකි බවත් බර්ට්‍රම් රසල් වරක් පළකර තිබේ.[38] එහෙත් මේ චින්තකයින් ප්‍රකාශ කරන පරිදි විට්ගන්ස්ටයින් කිසිම වාදයක් ගොඩනැංවූවෙකු හෝ තම වාදය පිළිගන්නා ලෙස ප්‍රකාශ කළ අයෙකු හෝ නොව භාෂාවේ විවිධ අවස්ථාවන් අප ඉදිරිපිට දිග හැරි අයෙකු පමණක්[39] බව පෝල්ගේ මතයයි. ඒ තුළින් දර්ශනික ගැටළුවල ස්වභාවය පැහැදිලි කර දීමට උත්සාහ ගත් බව පෙනේ. එසේ නම් දර්ශන ක්ෂෙත්‍රයෙන් පලාගිය නිශාරක්ෂක වාදයක් බිහිකළ චින්තකයෙකු ලෙස විට්ගන්ස්ටයින් හඳුන්වා දීම සප්‍රමාණ බවින් තොර තර්කයකි. එපමණක් නොව විට්ගන්ස්ටයින් තම මුල් කාලයේ තමා අතින් ඉදිරිපත් වූ අදහස්වල නිශ්ප්‍රමාණතාව පවා පිළිගත් බව සඳහන් වේ. එහෙත් තම අදහස් සම්පූර්ණයෙන්ම නිශ්ප්‍රභාග විය යුතුයයි ඔහු නොපිළිගනු ලැබූ බව එරික් ස්ටීනාස් පෙන්වා දෙයි.[40]

''දර්ශනික ගවේෂණ'' නම් කෘතියේ සහ පසුකාලීනව පළ වූ ලේඛනවලින් විට්ගන්ස්ටයින්ගේ පශ්චාත්කාලීන චින්තනය නියෝජනය වේ. විශේෂයෙන් දර්ශනික ගවේෂණ කෘතිය මගින් ඔහු මුල් කෘතියේ පිළිගත් මතයන්හි නිශ්ප්‍රමාණ බව පළකරනු ලැබුයේද භාෂා ක්‍රීඩා පිළිබඳ අදහස් පළ කරනු ලැබුයේ ද, මේ කෘතියෙනි. මෙහි පරමාර්ථය වී ඇත්තේ භාෂා ක්‍රීඩා ආශ්‍රිතව දර්ශනික ප්‍රශ්න අර්ථවත් කිරීමය. එසේ නැතහොත් දර්ශනික ප්‍රශ්න යනු මොනවාද යන්න භාෂා ක්‍රීඩා තුළින් කොපමණ ප්‍රමාණයකට පැහැදිලි කළ හැකිද යන්න වේ. විට්ගන්ස්ටයින්ගේ මේ භාෂාමය ක්‍රීඩා දර්ශනික විමර්ශන සෛද්ධාන්තික ලෙස මැඩ පැවැත්වෙනසුලු උපක්‍රමයක්[41] ලෙස කලන්සූරිය හැඳින්වීම කෙතරම් තාර්කිකද යන්න ප්‍රශ්නයකි. එසේ වනුයේ ඔහු දර්ශනික ප්‍රශ්නවලින් පැනයාමට වඩා ඒවායේ ස්වභාවය පැහැදිලි කිරීමට ගත් උත්සාහයක් විට්ගන්ස්ටයින්ගේ චින්තාවන් තුළින් මතු වන නිසාය. දර්ශනය වනාහි වාදස්කන්ධයක් නොව ක්‍රියාවලියක්[42] යන්න විට්ගන්ස්ටයින් පිළිගත්තකි. එසේනම් ඔහු අලස නිහඬතාවක් දර්ශනය තුළින් ඉදිරිපත් කළේ[43] යයි ප්‍රකාශ කිරීම තාර්කික බවින් හීනය. දර්ශනය අවශ්‍යයෙන්ම ප්‍රකට කිරීමක් බව ඔහු ද පිළිගන්නකු බව ඔහුගේ ඉහත ප්‍රකාශනයෙන්ම පැහැදිලි වන්නකි. එසේනම් ඔහු ශූන්‍යවාදියෙකු ලෙස කෙසේ දක්විය හැකිද? යමක් ප්‍රකාශ කළ නොහැකි නම් නිහඬවිය යුතුය යන ඔහුගේ ප්‍රධාන ප්‍රස්තුතවල සත්වන ප්‍රස්තුතයෙන් ඔහු ගුප්ත අලස චින්තකයකු ලෙස දක්වාලීම තාර්කික දෝෂයකි. ඔහු එවැනි නිගමනයකට එළඹී ඇත්තේ අවසාන විග්‍රහයක් කරා ළඟා වීමට මිනිස් චින්තාවන් පිළිබඳ පවතින සීමා විමර්ශනයක් තුළිනි. සකල දර්ශනයම භාෂා විචාරයකි, යන මතය ඔහුගේ පශ්චාත්කාලීන චින්තනයෙන් සංශෝධනය කර ඇති බව පෙනේ.

---

36. ද. පු. ඥ. පි. X1
37. ද. පු. ඥ. පි. X1
38. ද. පු. ඥ. පි. X1
39. L.P.W. p. 28
40. Stenius, Erik, Wittgensteins Tractatus - A critical exposition of its main lines of thought, Basil and Blackwell, London, 1964, p. 16.
41. ද. පු. ඥ. පි. X1
42. Trac. p. 49, No. 4. 112
43. ද. පු. ඥ. පි. X11

විට්ගන්ස්ටයින් භාෂාව පිළිබඳ ඉදිරිපත් කළ අදහස් අතුරින් තවත් විවාදයට මුල් වූවක් නම් වචනයක අර්ථය එහි භාවිතයයි පැවැසීමය.[44] මහාචාර්ය පෙන්ඩිලේ පෙන්වා දී ඇත්තේ විට්ගන්ස්ටයින් යෝජනා කළේ සිතිය හැකි අර්ථභව්‍යතා අතුරින් එකක් පිළිබඳව බවයි.[45] ඔහු භාවිතය යනුවෙන් අදහස් කළේ එබඳු මුල් අදහසක් බවය, මහාචාර්ය පෙන්ඩිලේ විසින් හඳුන්වා දී ඇත්තේ. මෙම භාවිත වාදය ඉදිරිපත් කරමින් යථානුභූතිවාදීන් ගොඩනැංවූ සත්‍යොක්ෂණ සිද්ධාන්තය, තාර්කික විභ්‍රමතා වලට ගොදුරුවන බව පෙන්වා දී ඇත. එපමණක් නොව විට්ගන්ස්ටයින්ගේන් ඇරඹුණු භාවිතවාදය පිළිබඳ දර්ශන ක්ෂෙත්‍රයේ එකඟතාවක් නොමැති බව කලන්සූරිය කියා සිටී[46]. එහෙත් ඩේවිඩ් පොල්ගේ මතය වනුයේ විට්ගන්ස්ටයින් චින්තන පද්ධතීන්ගේ දැඩි භාවය බිඳීම ඔහුගේ අරමුණ වූ බවයි.[47] විලියම් පී. ඇලස්ටන් වැනි අය පවා පෙන්වා දී ඇත්තේ භාවිත අර්ථය විවිධ අයුරින් අර්ථ දීපනයන්හි යෙදිය හැකි බවයි; යෙදෙනබවයි. මෙහි දක්වා ඇති විස්තරය ඔහු මනාලෙස විග්‍රහ කරන අවස්ථා පෙන්නුම් කරන්නෙකි.[48] සියළුම දර්ශනික ප්‍රශ්න සඳහා නිශ්චිත විසඳුමක් ලැබෙතැයි ඔහු විශ්වාස කළ බව පෙනේ. ඔහුගේ චින්තනය තුළ දැකිය හැකි විෂමතාව ද එයයි. එහෙත් එම නිසාම ඔහු දර්ශනයෙන් පළා ගිය අයෙකු ලෙස පෙන්වීම අතාර්කිකය.

විට්ගන්ස්ටයින් භාෂා මාධ්‍යයට නැගිය නොහැකි දේ ගැන මෙසේ පවසයි: ''වචනයට නැගිය නොහැකි දේ නිසැකයෙන්ම පවතියි''[49] මූලික බුදුසමයේ බුදුන්වහන්සේ පිළිබඳව මෙසේ කියවේ: තථාගත තෙමේ මහා සමුද්‍රය මෙන් ගැඹුරුය. අප්‍රමේයය. මිනිය නොහැක.[50] මින් කියවුනේ තථාගතයන් විස්තර කිරීමට යාමේදී භාෂා මාධ්‍යයේ අපූර්ණභාවය හෙළිවන වගයි. එසේම විස්තර කළ නොහැකි, භාෂාවකට පෙරළිය නොහැකි දේ පැවතිය හැකි බවයි.

මේ හා සමාන චින්තාවක් ඉදිරිපත් කළ විට්ගන්ස්ටයින් භාෂා මාධ්‍යයෙන් අර්ථ සම්පන්නව යම් තත්ත්වයක් හෝ සිද්ධියක් විස්තර කළ නොහැකි නම් ඒ පිළිබඳව නිශ්ශබ්දව සිටීම වඩා නැණවත් යයි පෙන්වා දී ඇත. ඒ අදහස තුළින් පවතින තත්වයන් හා පැවතිය යුතු සම්භාව්‍යයක් විස්තර කළා මිස ඔහු දර්ශනික ප්‍රශ්නවලදී අලස නිහඬතාවක් දැක්වූ චින්තකයකු ලෙස නිගමනය කිරීම තාර්කික දෝෂයකි.

දර්ශනය අවශ්‍යයෙන්ම නිරාකුල වුවමනා බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. එම නිරාකුල බව ඇති කිරීම කළ හැකි මග ලෙස විට්ගන්ස්ටයින් දුටුවේ භාෂා විශ්ලේෂණයයි. භාෂා විශ්ලේෂණය තුළින් චින්තනයත් යථාභූතයත් අර්ථවත් කිරීමට ගත් උත්සාහය ඔහුගේ ප්‍රකාශන තුළින් ගම්‍යවේ. ඔහු මුලදී දරූ සමහර දැඩි මතයන් පසුව වෙනස් කළ බවට සාක්ෂි ඔහුගේ පසු කාලීන චින්තනයෙන් ඉදිරිපත් කර ඇත. භාෂා විශ්ලේෂණය දර්ශනයේ අංශයක් ලෙස නොකිව හැකිවා පමණක් නොව එය එකම දර්ශනය ලෙසද පිළිගත යුතු නැත. ''භාෂාමය දර්ශනය වනාහි දර්ශනය වේ. දර්ශනය වනාහි භාෂාමය විභජනය වේ'' යන්න බොහෝදුරට අන්තවාදී ප්‍රකාශනයක්ය යන මතය තාර්කික විභ්‍රම තාවකි.

---

44. Wittgenstein, L. - Philosophical investigation, Basil blackwells, Oxford, 1953. p. 20e.
45. Philosphy xxx, Review of philosophical investigation, The Journal of the Royal institute of philosophy, McMillan, London, 1955, p. 174.
46. ද. ප්‍ර. ඥ. පි. 128—29
47. L.P.W. p. 28
48. Alston, W. P. - Meaning and Use. (T.M.) p. 142-3.
49. Trac. No. 6. 22
50. මජ්ඣිම නිකාය ප්‍රථම භාගය, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 10, 1964 පිට 171.

එසේ වුවද ට්‍රැක්ටේටස්වලින් කියවුණු සමහර ප්‍රකාශනවල සාවද්‍යතාව විට්ගන්ස්ටයින් පවා පිළිගනු ලැබූ බව ඉහතින් සඳහන් විය. එසේ නම් ඔහු නිශාරක්ෂකවාදියෙකුද දර්ශනයේ අලස නිහඬතාවක් දක්වූ චින්තකයෙකු ලෙස හැඳින්වීම සප්‍රමාණ බවින් තොරවූ තර්කයක් බව පෙනේ. විට්ගන්ස්ටයින් දර්ශනයේ ඇති ගැටළු විසඳූ අයෙකුට වඩා ඒ දර්ශනික පැන තීව්‍රකළ විසුරුවාහළ චින්තකයෙකු ලෙසද විස්ඩම් හඳුන්වයි.[51] කරුණු මෙසේ නම් ඔහු දර්ශනික ප්‍රශ්නවලදී අලස නිහඬතාවක් දැරුවෙකැයි නිගමනය කිරීම කෙතරම් දුරට තාර්කික ප්‍රකාශයක්දැයි තීරණය කළ යුතු වන්නේ භාෂා විශ්ලේෂී උපක්‍රමය මගින් සැහෙන දුරකට අධිභෞතික ගැටළුවල ස්වාභාවය විශ්ලේෂණය කිරීමටත්, එම උපක්‍රමයෙන් දර්ශනික වාදයන්හි දුර්වලතා දැකගැනීමටත් විට්ගන්ස්ටයින් පොහොසත් වී ඇති බව පිරික්සීමෙනි.[52]

51. Wisdom, John. - Paradox and discovery, Basil blackwells Oxford 1965. p. 88.
52. Russel, B. ed, Wisdom of the West, Foulkes Mc Donald, London 1959. p. 309.